# ලෝකයේ  රිය අනතුරු සඳහා බලපාන සාධක පිළිබඳ ආනුභවික අධ්‍යයනයක්

**ජී. එල්. ඩී. එච්. සී. මදුසංක**[1]

**සංක්ෂේපය**

21 වන සියවස වන විට ලෝක ජනගහනය බිලියන 7.4 ක් පමණ වන අතර ජනගහනයේ සිදු වන මෙම සීඝ්‍ර වර්ධනය හා කාර්මීකරණයත් සමග ඔවුන්ගේ අවශ්‍යතා හා උවමනාවන් ද පුළුල් වී තිබේ. මේ සමඟ ම මොවුන්ගේ වුවමනා කාර්යක්ෂමව සිදුකර ගැනීම පිණිස රථ වාහන භාවිතය  දිනෙන් දින ඉහළ යමින් පවතී. මේ හේතුවෙන් ලෝකයේ සිදුවන රිය අනතුරු ප්‍රමාණය ද දිනෙන් දින ඉහළ යමින් පවතී. ලෝක සෞඛ්‍යය සංවිධානයේ වාර්තාවලට අනුව රිය අනතුරු වලින් වර්ෂයකට ලෝකයේ පුද්ගලයින් මිලියන 1.25ක් පමණ ජීවිතක්ෂයට පත්වන අතර පුද්ගලයින් මිලියන 20-50ක් පමණ ආබාධයට ලක් වේ. එමනිසා මෙම අධ්‍යයනය ලෝකයේ රිය අනතුරු සඳහා බලපාන සාධක හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් සිදු කරන ලදී. මේ සඳහා ලෝකයේ විවිධ පර්යේෂකයින් විසින් සිදුකරන ලද පර්යේෂණ, පොත් පත්, පුවත් පත්, සඟරා ආදී ද්වීතික දත්ත මූලාශ්‍ර අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනයට අනුව නිදිමත, තෙහෙට්ටුව, අධික වෙහෙස, රියැදුරන්ගේ වයස, අධ්‍යාපන මට්ටම, වෘත්තිය මට්ටම, පුමිතිරිභාවය, රියැදුරු බලපත්‍රය, ගමන් ගන්නා වේගය, විවිධ උපාංග භාවිතය, සට්ටනීය ස්ථානය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය, පෞද්ගලික තත්ත්වය හා ස්ත්‍රී පුරුෂ බව  රිය අනතුරු සඳහා බලපාන සාධක ලෙස හඳුනා ගන්නා ලදී. ඒ අතරින් වේගය සහ මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය රිය අනතුරු සඳහා  වැඩිම බලපෑමක් සිදු කරන සාධක ලෙස හඳුනා ගන්නා ලදී.

**මුඛ්‍ය පද** : රිය අනතුරු, ආනුභවික අධ්‍යයනය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය, පුමිතිරිභාවය

---

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hchamithmadusanka@gmail.com